**ශීර්ෂ 321 - නැගෙනහිර පළාත් සභාව - 2023**

-----------------------------------------------

1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

-------------------------------------

1.1 දැක්ම

-------

පළාතේ ජනතාවගේ අවශ්‍යතා හා අපේක්ෂා තෘප්තිමත් කරන උසස් පාලන ක්‍රමයක් ඇති කිරීම.

1.2 මෙහෙවර

-----------

ජනතාවගේ වැඩිදියුණු වූ ජීවන තත්ත්වයක් උදෙසා කාර්යක්ෂම හා ඵලදායී සේවයක් ලබාදීම සඳහා සම්පත් එක්රැස් කිරීම හා ඒවා ප්‍රශස්ත ලෙස භාවිතයට ගැනීම.

1.3 ප්‍රධාන කාර්යයන්

-------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

2. මුළු ප්‍රතිපාදනය හා වියදම

------------------------------

නැගෙනහිර පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 43,451 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 39,164.47 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 4,286.53 ක් හෙවත් සියයට 9.9 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2023 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 39,019.00 | 36,066.15 | 2,952.85 | 7.6 |
| මූලධන | 4,432.00 | 3,098.32 | 1,333.68 | 30.1 |
| එකතුව | 43,451.00 | 39,164.47 | 4,286.53 | 9.9 |

3. විගණන නිරීක්ෂණය

-----------------------

ඉහත ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා දුන් ප්‍රතිපාදන පළාත් සභා අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනයන් සිදුකර තිබුණි. පළාත් සභා අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.